# මගේ නිවුන් මල්ලීලා



තරුෂි අමායා ගුණවර්ධන

# මගේ නිවුන් මල්ලිලා

කතෘෘ

තරුෂි අමායා ගුණවර්ධන

චිත්‍ර

තරුෂි අමායා ගුණවර්ධන

ISBN 978-624-208-270-7

දිනය

2025.02.08

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **“හෙරණගත්කරණී”** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජිවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

# පටුන


| | පිටුඅංකය |
|---|---|
| මල්ලිලා ගැන පළවෙනි ආරංචිය | 4 |
| අමුත්තන් දෙන්නෙක් ගෙදරට එයි | 6 |
| සද්ද වැඩිම ගෙදර අපේ | 8 |
| එළියට පනින මගේ ඉරිසියාව | 10 |
| කවදාවත් වැඩි වෙන්නේ නැති බර | 12 |
| ගුටි කෙළි | 14 |
| ගස් පිස්සුව | 16 |
| හැමෝටම නමක් | 18 |
| මල්ලිලා නිසා කොණ්ඩේ අඩුවන හැටි | 19 |
| Guinea pig සෙල්ලම සහ එයාලගේ සින්දු | 22 |
| Montessori භීතිකාව | 24 |
| තවත් පිස්සු වැඩ සහ වැඩිම ආදරේ | 25 |



# මල්ලිලා ගැන පළවෙනි ආරංචිය

මගේ නම තරුෂි. ඉස්සර මම තමා පවුලේ එකම හුරතලා. මට හැමෝම ආදරෙයි. ඒ කාලේ මට  හිටියේ අයියා කෙනෙක් විතරයි. එයාගේ නම  යශෝද්. එයා ලොකු අම්මගේ පුතා. එයා තමයි හැමදේටම මට හිටියේ. දවසක් මට මතකයි අම්මා අහනව "ඔයාට ඕනෙ මල්ලි බබෙක්ද නංගි බබෙක් ද?" කියලා. මම කිව්වා "මට මොකටද කවුරුත්? මට ඉන්නවනෙ අයියෙක්".

එදා ඉඳන් මගේ අම්මගේ බඩ ටිකෙන් ටික ලොකු වුණා. අම්මා නිතර නිතර දොස්තරලා හම්බවෙන්න ගියා. දවසක් අම්මා කිව්වා "එක්කෙනෙක් නෙවෙයි. මම ඔයාට මල්ලි බබාලා දෙන්නෙක්ම ගේනවා" කියලා. "මල්ලිලාම දෙන්නෙක්? කොච්චර ශෝක්ද?" කියලා මට හිතුණා. ඒත් කවුද හිතුවේ මෙහෙම වෙයි කියලා.



# අමුත්තන් දෙන්නෙක් ගෙදරට එයි

මට ඒ වෙද්දි වයස අවුරුදු පහයි. මම ඉස්කෝලේ යන්නත් පටන් ගත්තා විතරයි. ඒ කාලේ Covid වසංගතය තිබ්බ නිසා හැමෝම ඉතාම පරිස්සමින් ගමන්බිමන් ගියේ. මගේ අම්මා දවස් ටිකකට ඉස්පිරිතාලේ නැවතිලා හිටියා. මට ඒ දවස්වල හරිම පාළුවක් දැනුනා.

ටික දවසක් ඉස්පිරිතාලේ ඉඳලා අම්මා එනකොට නිල්පාට පොට්ටනි දෙකක් තුරුලු කරගෙන ආවා. ඒක ඇතුලෙ හිටියා මී පැටව් දෙන්නෙක්. Covid නිසා ඒගොල්ලන්ව නාවලාම තමා ගේ ඇතුලට ගත්තේ. නාවන කොට එච්චර වෙලා නිදාගෙන හිටපු ඒගොල්ලෝ මහා හයියෙන් ඇඬුවා. එදා ඉඳන් අපේ ගෙදර සද්දෙ වැඩි වුණා.

ඒගොල්ලෝ කරපු පළවෙනි වීර වැඩේ අම්මා මට කිව්වා. මල්ලිලා ඉපදුන දවසේ නිදා ගෙන ඉන්නකොට, එක මල්ලියෙක් අනිත් මල්ලිගේ ඇඟ උඩ චූ දාලා. චූ වැටිච්ච මල්ලි දාපු මල්ලියට පයින් ගහලා. දෙන්නම හයියෙන් ඇඬුවලු.



# සද්ද වැඩිම ගෙදර අපේ

මල්ලිලා ගෙදරට ගෙනාපු දවසේ ඉදන් අපේ ගෙදර ගමේ සද්දෙ වැඩිම ගෙදර වුණා. මම හිතන්නේ ගමේ අය අපේ ගෙදරට කියන්නේ “Loud house” කියලා වෙන්නැති. දෙන්නම මල්ලිලා වුනාට අපි ඒ දෙන්නගෙන් එක්කෙනෙක්ට කිව්වේ "අයියා බබා", අනිත් එක්කෙනාට "මල්ලි බබා" කියලා. මොකද අයියා මල්ලි බබාට වඩා විනාඩියක් වැඩිමහල් නිසා. මොන විහිලුවක්ද? විනාඩියක් වැඩිමහල් කියලා අයියෙක් වෙන එක. ඒ දෙන්නාගේ නම් "නෙතුක" සහ "නෙතුල්".

මුලින්ම ඒගොල්ලෝ අඩන්න පටන් ගත්තේ "අල්ලා අල්ලා" කියලා. අපි හිතුවේ ඒ ගොල්ලෝ මැරිලා ඉපදුන මුස්ලිම්වරු දෙන්නෙක් කියලා. අයියා බබාගේ කටහඬ තමා සද්දම. මට මතකයි, එක දවසක් මල්ලිලාට බෙහෙත් විදලා, අයියා බබා කොච්චර හයියෙන් ඇඬුවද කිව්වොත් පහුවෙනිදාට අයියා බබාගේ කටහඬ නැති වුණා. ඩොක්ටර් ගාවටත් යන්න වුණා. මට චුට්ටක් සතුටු හිතුනා. අඩුම තරම එක මල්ලියෙක් හරි කෑ ගහන එක අඩු වුණ හින්දා. කාලෙත් එක්කම ඒගොල්ලෝ අඩන විදිය වෙනස් වුණා, කාලයක් "මුවා මුවා" කියලා ඇඬුවා. ඊට පස්සේ "අනේ අනේ" කියලා ඇඬුවා.

ඕනෙම දෙයක් දිනාගන්නේ අඬලම තමා. හැබැයි ඒගොල්ලන්ට තමා කෑගහන්න අයිතිය තියෙන්නේ. අපි කෑගහනකොට (විශේෂයෙන් මල්ලිලා නිදාගෙන ඉන්න අතරේ) අපිට අත්තා ඇවිල්ලා හොඳටම බනිනවා. ඒ වෙලාවට මට හොඳටම තරහ හිතෙනවා.


butter
Choco

# එළියට පනින මගේ ඉරිසියාව

මල්ලිලා ගෙදරට ආපු දවසේ ඉඳන් අම්මගේ වැඩේ කිරි පොවන එක. ඉස්සර කාලෙ අම්මා මාව ලඟින් තියාගෙන ඉන්නවා. දැන් හැමෝම බලන්නේ මල්ලිලා ගැන විතරයි. එතකොට මට හිතෙනවා කවුරුත් මට ආදරේ නෑ කියලා. නෑදෑයොත් තෑගි අරගෙන එනවා ඒගොල්ලන්ව බලන්න. අහල පහල අය මගෙන් අහන්නෙත් එයාලා ගැන. වෙලාවකට මට හිතෙනවා මල්ලිලාව ගෙනාපු තැනටම ගිහින් දාන්න. මම මේක යශෝද් අයියට කිව්වහම එයා කිව්වේ "හොඳ වැඩේ ඔයාට, ඔයා ආවහම මටත් ඔය වැඩේමයි වුනේ" කියලා.

ගමන් යද්දි එහෙම තාත්තා එක මල්ලියෙක්ව වඩාගෙන යනවා. අම්මා අනිත් මල්ලිව වඩාගෙන යනවා. මට එයාලගෙ අතවත් අල්ලගන්න විදිහක් නෑ. මල්ලිලාට චීස්, පලතුරු, යෝගට්, බලෙන් ඔබනවා. කවුරුත් ඒවා කන්න කියලා මට බල කරන්නේ නැහැ. මොකද මම ලොකුවෙලා ඉවරයිනේ. මම ඒවා අරගෙන කනවා. මම තරහට ඒවා කාලා ඉවර කරනවා. දැන් තමයි මට තේරෙන්නෙ, ඒ මගේ ඉරිසියාව කියලා.



# කවදාවත් වැඩි වෙන්නේ නැති බර

ගෙනාපු දවසේ ඉඳන් අම්මා මල්ලිලාට කිරි පොවනවා. බිත්තර, බටර්, අල තලපේ හදලා කවනවා. ගෙදර අය හැමෝම එකතුවෙලා චීස්, සමපෝෂ, පලතුරු කවනවා. මල්ලිලාගේ බර බලන දවසට හැමෝගෙම මූණ නරක් වෙනවා. මල්ලිලාගේ බර හැමදාම අඩුබරට අවදානමේ.

ඒකට මගේ බර! මහා කරදරයක්. හැමදාම වැඩි වෙනවා. ඒ කියන්නෙ මම ඉක්මනට ලොකු වෙනවා. හැමෝම මාව බලන එක අඩු වෙනවා. කවන එක අඩු වෙනවා. ඒ ගැන මට හරිම දුකයි. හැමදාම මල්ලි බබාගේ බර අයියා බබාගේ බරට වඩා කිලෝ එකක්වත් අඩුයි. මං හිතන්නේ මල්ලි බබා දඟ හින්දා වෙන්න ඇති. හැමෝම කියනවා මල්ලි බබාගෙ වගේ දැඟලිල්ලක් දැකලම නෑ කියල.

මල්ලිලාට කවන්න හරිම අමාරුයි. මුල් කාලයේ පාට පාට මල් දීලා කැව්වා. ඊට ටික දවසකට පස්සේ වතුර දුන්නා. ඊට පස්සේ කාලෙන් කාලෙට ඇට ජාති, ගස් වල අතු, පොල් කුඩු, දුන්නා. දැන් YouTube videos හරි, Video game එකක් හරි දාලා දීලා ඒගොල්ලන්ට කෑම කවනවා. ඒත් මල්ලිලාගේ කටට කොච්චර කෑම එබුවත් වැඩක් නෑ. මට දැනගන්න ඕනෙ ඒගොල්ලන්ට කවන ඒවා කොහේ යනවද කියලා. හැබැයි ඒ දෙන්නට කවන අයගේ නම් බර මදි නොකියන්න වැඩිවෙනවා.



# ගුටි කෙලි

දන්න දවසේ ඉඳලම මල්ලිලා දුකට, සතුටට, තරහට, හැමදේටම පොර කනවා. බලු පැටව් වගේ. ඒක පටන් ගන්නෙ ඇලවිලා. කොච්චර ඈත් කරලා තිබ්බත් කාන්දම් වගේ ඇලවෙනවා. අපේ ගෙදර අය එයාලා ඇලවෙනකොට දෙපැත්තට  අදිනවා. ඒ ඇලවෙන එක ඉවර වෙන්නේ ඇඬිල්ලකින් නිසා.

මුල් කාලෙ එයාලා හපා ගත්තා, දත් පාර හිටින්නම. තව වෙලාවට කොනිත්තනවා, සමහර විට ලේ එන්නම. මල්ලි බබාගේ තවම කොනිති තුවාල කැලැල් තියෙනවා. දැන් මදි නොකියන්න ගහගන්නවා. එක්කෙනෙක් කියන දේ අනිත් එක්කෙනා පිළිගත්තේ නැත්නම්, ඒකටත් ගහනවා. අඬන එක්කෙනා, ගුටි කාපු එක්කෙනා සනසවන්න ගහපු එක්කෙනාට බැන්නොත්, ගුටි කාපු කෙනා ගහපු කෙනාගේ පැත්ත ගන්නවා. මල්ලිලා දෙන්නා හැමවෙලේම ඉන්නේ එක පැත්තක. එක්කෙනා පස්සෙන් අනිත් එක්කෙනා පන්නනකොට ඒගොල්ලෝ ලේන් පැටවු වගේ.



# ගස් පිස්සුව

අපේ මල්ලිලා සමහර ගස් වලට හරි ආසයි. කොහේ හරි ලස්සන ගහක් තිබ්බොත්, ඒකෙ අතු ඉල්ලලා කරදර  කරනවා. එක එක ගස්වල අතු ගෙනල්ලා ඒවා වන වන ඉන්නවා. ඒ ගස් පිස්සුව පුරුදු වුණේ සුළි සුළං ගැන YouTube videos බලලා. ඒගොල්ලෝ වැනෙනවා ගස් වගේ. ඒ ගොල්ලොන්ගේ අත පය පණ නැති කරලා හොලවනවා. ඊට පස්සේ ගස් කඩාගෙන වැටෙනවා කියලා අපේ ඇඟට කඩාගෙන වැටෙනවා. එයාලා ඒකට හරි ආසයි. අනිත් අයගේ ඇඟට කඩාගෙන වැටෙන එක නම් මහ වදයක්.  මම Homework කරන වෙලාවට, එහෙම කරද්දි හැමදේම ඇද යනවා.

සමහර දවස්වලට එළුවන්ට කන්න දෙන්න වගේ ගාල් පිටින් වැටහිරියා ගස් කඩාගෙන එනවා. ඒගොල්ල වැටහිරිය කොළ වලට කියන්නේ "ගඳ කොළ" කියලා.  අත්තාට පෙන්නන්න බෑ ඔය ගඳ කොළ. තවත් සමහර දවසට පුංචි පැලයක් මුල් නැතිව ගෙනල්ලා, ඒක පෝච්චියක හිටවන්න කියලා කියනවා. ඊට පස්සේ ඒක මැළවුනාම කියනවා, ඒක කෙලින් කරන්න කියලා.  දෙවියන් වහන්සේටවත් කරන්න බැරි වැඩ තමා අපිට කරන්න කියන්නේ.

ලොකුම විහිළුව තමා ඒගොල්ලන්ට විතරයි ගස් අතු කඩන්න අයිතිය තියෙන්නේ. මල්ලිලා ඉද්දි රෝස ගස් කප්පාදු කලත් බැනුම් කෝටියයි. ඒ නිසා මල්ලිලාට හොරෙන් තමා අත්තා වත්ත සුද්ද කරන්නේ.



# හැමෝටම නමක්

අපේ මල්ලිලා උදෙන්ම ඇවිදින්න යන්න හරි ආසයි. මල්ලිලා ගෙදරම ඉන්න නිසා බලාගන්න කෙනා එයාලව අපි පදිංචි පැත්ත වටේම එක්කන් යනවා. වටපිටාවේ තියෙන ලස්සන ගස්වල කොළ කඩාගෙන එනවා.

එක ගෙදරක ආච්චි කෙනෙක් ඉන්නවා එයාගේ ගෙදර කොකෝවා ගහක් තියෙනවා. එයා අපේ මල්ලිලාට කොකෝව ගෙඩි හරි, කොල තියන අත්තක් කඩලා දෙනවා. මල්ලි බබාලා එයාට කියන්නේ "කොකෝවා අච්චි" කියලා. තව ගෙදරක සීයා කෙනෙක් ඉන්නවා. ඒ සීයගෙ ගෙදර ජම්බු ගහක් තියෙනවා. එයා මල්ලිලාට ජම්බු අතුයි, ගෙඩි කඩලා දෙනවා. මල්ලිලා ඒ සීයට කියන්නේ "ජම්බු සීයා" කියලා. මේ විදිහට වෙරළු ආන්ටි, ජෑම් සීයා, වගේ ගොඩක් අය ඉන්නවා. තව "සැපෝත (සැපදිල්ලා) ගෙදර", "සාමිනාමිනා (නමිනං) ගෙදර", "බෝමලි (ජම්බෝල) ගෙදර" වගේ නම් දාල තියෙනවා. "ඕනිනෝනි" ගහක් ගැන කියනවා. ඒක මොකක්ද කියලා අපි තාමත් හොයනවා.

අපේ පැත්තේ හැමෝම මල්ලිලාව අඳුරනවා. මම අවුරුදු දහයක් ඒ පැත්තම ජීවත් වෙලත් මාව වැඩිය කවුරුත් දන්නේ නැහැ. එයාලා එච්චර ප්‍රසිද්ධ වුණේ කොහොමද?


# මල්ලිලා නිසා කොණ්ඩේ අඩුවන හැටි

මල්ලිලා Clay, Slime වලට හරි ආසයි. දවසක් අම්මා මල්ලිලට Slime බෝතල් දෙකක් ගෙනත් දුන්නා. එයාල ඒකෙන් හරිම සතුටෙන් සෙල්ලම් කර කර හිටියා. මට මතක විදිහට මම හාන්සිවෙලා කතන්දර පොතක් කියව කියව හිටියේ. මල්ලිලා එකපාරට මහාහයියෙන් හිනාවුනා. මම "ඇයි?" කියල ඇහුවා. බැලින්නම් මගේ කොණ්ඩේට Slime දාලා. අපි ඒක අයින් කරන්න පුදුම මහන්සියක් ගත්තා. බැරිම තැන ඒ කොණ්ඩ ටික කපලා දැම්මා. එතනින් ඒ කොණ්ඩ නැට්ටක් වගේ ඉස්සුනා. හැමෝම හිනා වුණා. මට ඒ වෙලාවේ හිතුනා මල්ලිලාගේ කොන්ඩේ බූගාන්න.

තව දවසක් මම video game එකක් සෙල්ලම් කර කර ඉද්දි, මල්ලිලා කොළ කප කප හිටියේ. මීයෝ වගේ කොළ කීතු කීතු කරන්න එයාල හරි ආසයි. අයියා බබා කතුරක් අරගෙනම මං ළඟට ඇවිල්ලා, "අනේ මටත් Game එකක් දෙන්න" කියලා කිව්වා. මම සැරෙන්ම "බෑ" කිව්වා. එකපාරටම අයියා බබා මං දිහා බලලා, රවලා පිටිපස්සට ගියා. ඊට ටික වේලාවකට පස්සේ මම දැක්කේ එයා හයියෙන් හිනා වෙවී දුවනවා. බැලින්නන් එයා මගේ කොණ්ඩේ කෑල්ලක් කපලා. කවුරුත් අයියා බබාට ගැහුවේ නැහැ. "ඇයි එහෙම කළේ?" කියලා සැර කළා විතරයි. මට ඒ ගැන හරි දුකයි. එයාගෙන් "ඇයි අක්කිගෙ කොන්ඩේ කැපුවේ?" කියලා අහපුහාම, අයියා බබා කපටි උත්තරයක් දුන්නා. එයා කියනවා "ඔළුවේ හප්පෙක් හිටියා" කියලා.

මගේ විතරක් නෙමෙයි. එයාලගේ කොණ්ඩෙත් එයාලා කපාගන්නවා. දවසක් අයියා මල්ලිගෙ කොණ්ඩෙ කපලා, මල්ලි අයියගෙ කොණ්ඩෙ කපලා, කාමරේ හැම තැනම දාලා. “උඳුගොව්වෝ කාල වගේ” කියලා අම්මා ගොඩාක් දුක් උනා. හැබැයි මටයි යශෝද් අයියටයි නම් හරිම හිනා.




හලාය මේ, හෙලාය මේ.

## Guinea pig සෙල්ලම සහ එයාලගේ සින්දු

කවදාවත් ඇත්තටම දැකලා නැති උනත් මල්ලිලා Guinea pig ට හරිම ආසයි. සමහර වෙලාවට ඒගොල්ලෝ Guinea pig වෙලා අමුතු විදිහට නටනවා. ඒ නැටුමට සිංදුවකුත් හදලා තියෙනවා. ඒකට Guinea pig song කියල එයාලා කියන්නේ. ඒක මල්ලිලාම හදපු එකක්.

"කලාස සේ..... නෙලාස සේ..... කාශි ලාශි වින්ඩෝ කාලා ඊක්!"

තව ඒ විදිහෙම සින්දුවක් තියෙනවා.

"බිකි බිකි බම්මා කලාස සේ ......"

ඇත්තටම "කලාස සේ" කියන්නේ මොකක්ද? එයාලා ඇඟිලි තුඩු වලින් Guinea pig වගේ ඇවිදින ගමන් කියන සිංදුවක් තියනවා. ඒ තමයි,

"ටෙම්පො ලඩ්ටු, ලඩ්ටු,
ඩුංගුං ටැංගෝ, ඩුංගුං ටැංගෝ, ඩුංගුං ටැංගෝ, ටං ටං ටං
උඟනි නානි ඉස්ට කුඩිච්, උඟනි නානි ඉස්ට කුඩිච්"

මේ සින්දුවල තේරුම මොකක්ද කියලා අපි අදටත් හොයනවා. TV එකේ යන සින්දු හරි ඉක්මනට ඉගෙන ගන්නවා. එයාලා හරි ආසයි "ඩයස්ගේ නංගි" සින්දුවට. එයාලා ඒකෙ කියනවා,

"ඈ නම් සුරඅඟනක් වැනිය බොන්න වෙන්නේ ඩොම්පියො පැනිය".


පිරවෙදු මල් පිපිලා
දැක්කම හරි ආසයි
බක් අවුරුදු ඇවිදින
ටටටම සිරියාවයි

## **Montessori** භීතිකාව

අපේ මල්ලිලා ගෙදර ඉඳන් ඇට්ටර වෙන හින්දා වයස අවුරුදු තුන ලබපු ගමන් ඒගොල්ලන්ව Montessori දැම්මා. ඒගොල්ලෝ මුල් දවස් වල අලුත් Uniform දාගෙන, Lunch box එක, වතුර බෝතලේ අරගෙන ආසාවෙන් Montessori ගියා. ඒකෙ ටීචර් කෙනෙක්ට ආස හිතිලා ගෙදර ඇවිල්ලා එයා වගේ සාරි ඇඳගෙන, එයා කියන සිංදු කිය කියා නටනවා. රෙදි අර ගෙන ඇවිත් සාරි අන්දවන්න කියන එක හැමෝටම වදයක් වෙලා තිබ්බෙ. මොකද එයාලගෙ දැඟලිල්ලට සාරිය එක විනාඩියක් ඇඟේ තියෙන්නෑ.

එක දවසක් ඒ ටීචර්, පාඩම් කියලා දෙනකොට මල්ලිලා දෙන්නා ඉඹ ගන්නවා, හිනා වෙනවා, කතා කරනවා කියල ඒ දෙන්නව දෙපොලකට දාලා. එදා තමා අපි දැනගත්තේ මල්ලිලාගේ සැර. ඒ දෙන්නව වෙන්කලා කියල අයියා බබා තරහට පොළොවේ කකුල් හප්පලා හූ තියා තියා ඇඬුවාලු."ඒ මගෙ මල්ලි, එයා මට දෙන්න" කියලා ටීචර්ට සැර කරලා. මල්ලි බබා තියෙන තරහට කලිසමේ චූ දාගෙන හූ තියා තියා අඬලා. එදා ඉඳන් මල්ලිලා Montessori යන්න කැමති නෑ. ඊටපසසේ කවදාවත් සාරි ඇන්දෙත්නෑ.

බලෙන් Montessori ගිහින් දැමමොත් දවස් ගානක් ලෙඩවෙනවා. පස්සෙ Montessori යවන එක අතඇරියා. දැන් මල්ලිලාව ඕනේ වෙලාවක බය කරන්න පුළුවන්. Montessori යවනවා කියලා කිව්වොත් වැරදි කරන්නෙම නෑ. කොටින්ම කියනවනම් ඉස්කෝලෙ යන දවස්වල අන්දපු Underwear අන්දවන්න තාමත් බෑ.

# තවත් පිස්සු වැඩ සහ වැඩිම ආදරේ

අපේ මල්ලිලා කරදර කරන එකේ කෙළවරක් නෑ. හැබැයි, ඒ වගේම අපිව හිනා ගස්සන එක කෙළවරකුත් නෑ. සමහර වෙලාවට පුදුම වදයක් දීලා කුකුලෙක් වගේ නටනවා.

අම්මගේ Phone එකෙන් අපේ වැඩක් කරගන්න දෙන්නෙම නෑ. ඒක අරගෙනම තමා පස්ස බලන්නේ. Password patterns මතක තියාගන්නවා. බැරිම තැන අම්මා Face lock දාලා තියෙනවා. දැන් ඒගොල්ලන් නොදැනෙන්න අම්මගේ මූනට Phone එක අල්ලලා Unlock කරගන්නවා. වැඩියෙන්ම Phone එකේ කරන්නේ Video games සෙල්ලම් කරන එක. දෙන්නම Fruit merge කියන Game එකට ආසයි, ඒත් ඒගොල්ලෝ පැරදෙන කොට ඒගොල්ලොන්ට ඒක දරාගන්න බෑ. Fruit merge එක ගැන එයාලා එක එක විහිලුකතා කියනවා. “Monkey දෙක්කෙනෙක් හැප්පුනහම Donkey කෙනෙක් එනවා. Donkey දෙක්කෙනෙක් හැප්පුනහම අක්කි කෙනෙක් එනවා” කියලා කියනවා. හැමෝම හිනාවෙනවා. ඕන Game එකක් ගහ ගත්තට මට කමක් නෑ. ඒත් මොනවටද මාව ගාව ගන්නේ?

මල්ලිලාට තියෙන්නේ හරිම අමුතු සෙල්ලම්. රොටි හදන දවස් වලට ඒගොල්ලන්ට පිටි ගුලියක් දෙන්නම ඕනේ. මල්ලිලා ඒක Slab එකේ ඇලවෙනකල් උඩ දානවා. ඊට පස්සේ බිම වැටෙනකල් බලාගෙන ඉන්නවා. කොහේවත් යන මගේ මූණට තමා ඒ රොටිගුලියත් වැටෙන්නේ.

වෙලාවකට මල්ලිලා ඉන්න එක හරිම වදයක්. ඒගොල්ලෝ හැමෝටම කරදර කරනවා. අම්මලාට හරිම වියදම්. ඒත් මල්ලිලා නිදාගත්තහම, කොහේ හරි ගියහම හරිම පාලුයි. එයාල අඬද්දි මට ගොඩක් දුක හිතෙනවා. අසනීපවෙලා ඉද්දි හිත රිදෙනවා. ඒ දෙන්නා මේ ලෝකෙ වැඩිපුරම ආදරේ මටලු. මම දැන් දන්නවා මල්ලිලා තමා මට ජීවිතේ හම්බවෙලා තියෙන හොඳම තෑග්ග කියලා.



# පසුවදන



රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විහවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශිය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරි මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,

සෙනෙවිරත්න මහලේකම්